**රණවිරු සේවා අධිකාරිය - 2017**

**-----------------------------------------------**

රණවිරු සේවා අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරි පනතේ 9(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් රණවිරු සේවා අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------------**

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.**

**2** **මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට රණවිරු සේවා අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**----------------------------------------**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07**

**------------------------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ)** **ප්‍රමිතයේ 49 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම අයත්වන දේපළ පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කල යුතුය. කෙසේවෙතත්, අධිකාරියේ ඉඩම් ගොඩනැගිලි වටිනාකමට ඇතුළත්වූ ප්‍රධාන කාර්යාල ඉඩම හා ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රත්‍යාගණනයකර එහි වටිනාකම ගිණුම්ගත කර තිබුණු නමුත් අධිකාරි විසින් 2013 වර්ෂයේදී අත්පත් කර ගෙන තිබුණු මයිලපිටිය ප්‍රදේශයේ පිහිටි රණවිරු උද්‍යානය, එහි පිරිවැය වූ රු.2,872,387 ක වටිනාකම මත ගිණුම්ගත කර තිබුණි.**

**(ආ)** **ප්‍රමිතයේ 90 ඡේදය ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී ප්‍රත්‍යාගණනය ක්‍රියාත්මක වන දිනය, තක්සේරුකරු පිළිබඳ තොරතුරු, වත්කම්වල සාධාරණ වටිනාකම ඇස්තමේන්තු කිරීමේදී අනුගමනය කළ ක්‍රමවේදය සහ වැදගත් උපකල්පනයන් හෙළිදරව් කර නොතිබුණි.**

**2.2.2** **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**------------------------**

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි ඡේද අංක 48 ප්‍රකාරව, අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර ආදායම් හා වියදම් එකිනෙකට හිලව් නොකල යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා වූ රු.862,760 ක අඩමාන ණය අධි වෙන්කිරීම්, අධිකාරියේ ආදායමට බැර කිරීම වෙනුවට බොල්ණය වියදමෙන් අඩුකර දක්වා තිබුණි.**

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂවලදී පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු පර්චස් 24.90 ක් වූ ඉඩම් කොටස් 02 ක හිමිකම සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය වෙත පවරාගෙන තිබුණු නමුත් එහි වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, වටිනාකම රු.60,590,000 ක් ලෙස තක්සේරු කර තිබුණු අධිකාරියට අයත් වෙනත් ඉඩම් කොටස් 03 ක වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) ඵලදායී ජීවිත කාලය පිළිබඳව සැලකිල්ලට නොගෙන පිරිවැය රු.11,239,262 ක් වූ විදුලි සෝපානයද, කාර්යාල ගොඩනැඟිල්ල යටතේ ප්‍රත්‍යාගණනය කර තිබුණු අතර ගොඩනැඟිල්ල සඳහා වූ සියයට 05 ක්ෂය අනුපාතය මත ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රතිලාභීන් වෙත ලබාදී තිබුණු ණය ශේෂය රු.100,053,628 ක් වුවත් විගණනය සඳහා ලබාදුන් කේවල ශේෂ සාරාංශ අනුව ණය ශේෂය රු.99,963,300 ක් වූයෙන් රු.90,328 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ණය ශේෂය සඳහා වූ සේවා ගාස්තු ආදායම, රු.11,558,510 ක් වුවද කේවල ශේෂ සාරාංශය අනුව එම වටිනාකම රු.12,016,481 වූයෙන් රු.457,971 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

2009 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල බාහිර පාර්ශවයන්ගෙන් අධිකාරිය වෙත පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.2,310,336 ක්වූ විවිධ වත්කම් පිළිබද විස්තර ඇතුලත් පරිත්‍යාග ලේඛනය විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂය අවසානයට නිවාස ණය ප්‍රතිලාභීන් 10 දෙනෙකුගෙන් ලැබිය යුතුව පැවති රු.595,709 ක ණය ශේෂයෙන් වර්ෂ 2 සිට වර්ෂ 8 දක්වා කාලය තුල කිසිදු වාරිකයක් අයවී නොතිබුණු බව නිරීක්ෂණය විය.

**2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 110 | අධිකාරිය විසින් හානි පිළිබද ලේඛනයක් පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | **2016** දෙසැම්බර් **29** දිනැති අංක **30/2016** දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස **12** ක කාලසීමාවකින් හෝ කි.මී.**25,000** ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසු ඉන්ධන පරීක්ෂාවක් සිදුකළ යුතු වුවත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ වාහන සඳහා ඉන්ධන වැයවීම් පිළිබඳ පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. |
| (ඇ) | **2015** ජුලි **14** දිනැති අංක **03/2015** දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අදාල කාර්යය නිමකල වහාම අත්තිකාරම් මුදල් පියවිය යුතු වුවත් **2014** වර්ෂය තුලදී අධිකාරියේ නිලධාරීන් දෙදෙනෙකුට අවස්ථා **5** කදී ලබා දී තිබූ රු.**1,830,450** ක් වූ අත්තිකාරම් **2017** දෙසැම්බර් **31** දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. |

**3** මූල්‍ය සමාලෝචනය

---------------------–

**3.1** මූල්‍ය ප්‍රතිඵල

------------–––

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු. **61,412,678** ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. රු.**32,013,286** ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.**29,399,392** කින් තවදුරටත් පිරිහීමක් නිරීක්ෂණය විය. තවද සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ සමස්ත ආදායම රු.**27,317,324** කින් වැඩි වී තිබුණද, සැපයීම් වියදම රු.**4,342,661** කින්, ගිවිසුම්ගත සේවා වියදම රු.**9,231,860** කින් හා ව්‍යාපෘති වියදම රු.**23,523,574** කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ **04** ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී **2013** වර්ෂයේ රු.**12,301,556** ක්ව පැවති අධිකාරියේ මෙහෙයුම් ඌණතාවය පසු වර්ෂ වලදී තවදුරටත් පිරිහීමකට භාජනය වී තිබුණු අතර **2017** දෙසැම්බර් **31** දින වන විට එම අගය රු.**61,412,678** ක ඌනතාවයක් බවට පත්වී තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසුව **2013** වර්ෂයේ අවසානයට පැවති රු.**14,882,175** ක්වූ අධිකාරියේ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු.**1,159,434** ක් දක්වා පිරිහී තිබුණි.

**4.** මෙහෙයුම් සමාලෝචනය

---------------------------

**4.1** කාර්යය සාධනය

-------------------

**4.1.1** ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **1999** අංක **54** දරන රණවිරු සේවා අධිකාරි පනතේ **6** වන වගන්තිය අනුව ක්‍රියාන්විතයේදී ආබාධිත තත්ත්වයට පත්වූ රණවිරුවන් සහ මියගිය රණවිරුවන් හා සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලීසියේ සියලුම රණවිරුවන් සහ ඔවුන්ගේ යැපෙන්නන් පිළිබඳව තොරතුරු ඇතුළත් නාමලේඛනයක් අධිකාරිය ආරම්භ කර දින **60** ක් ඇතුළත

පිළියෙල කර එය අඛණ්ඩව යාවත්කාලීන කළයුතු බව සඳහන් වුවත් අධිකාරිය ආරම්භ කර වර්ෂ 15 ක් ගත වුවද පරිපූර්ණ නාමලේඛනයක් සැකසීමට හා අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. මේ කාර්යය සඳහා රණවිරු සංසද 269 ක් පිහිටුවා වසර 11 ක් ගතවී තිබුණු අතර දත්ත පද්ධතියට අවශ්‍ය තොරතුරු රැස්කිරීම සඳහා 2011 සිට 2014 වර්ෂය දක්වා රු.12,958,801 ක මුදලක්ද වැයකර තිබුණු නමුත් මේ පිළිබඳ සිදුකල ගැඹුරු පරීක්ෂාවන් වලදී රණවිරු සංසද සාමාජිකයන් සහ ඔවුන්ගේ යැපෙන්නන් පිළිබඳ සම්පූර්ණ තොරතුරු අධිකාරිය සතුව නොපවතින බවට තොරතුරු අනාවරණය විය.

(ආ) රණවිරුවන්ගේ සුභසාධන කටයුතු සඳහා අධිකාරිය වෙත 2009 වර්ෂයේදී පරිත්‍යාග කර තිබුණු අකුරැස්ස යාකබැද්ද ප්‍රදේශයේ පිහිටි නිවාසයක් සහිත පර්චස් 302 ක ඉඩම ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් රු.9,366,285 ක වියදමක් දරා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සුභසාධන කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය යටතේ 2017 වර්ෂය තුළ අර්ධ නිවාස 450 ක්ද නව නිවාස 300 ක්ද ඉදි කිරීමට සැලසුම්කර තිබුණු අතර ඒ යටතේ 2017 දෙසැම්බර් 31 දින වන විට නව නිවාස 192 ක් ඉදි කිරීම සඳහා වාරික වශයෙන් මුදල් ලබාදී තිබුණි. එදිනට අර්ධ නිවාස සඳහා කිසිදු ප්‍රතිලාභියෙකුට නිවාස ණය ලබාදී නොතිබුණු අතර නව නිවාස ඉදිකිරීම සඳහා 15 දෙනෙකු ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර රු.130,000 බැගින් රු.1,950,000 ක මුදලක් ලබාගෙන තිබුණු බව හෙළිදරව් වී තිබුණි. ඒ සම්බන්ධයෙන් පසු පරීක්ෂාවක් සිදුකිරීමේ කටයුතු දුර්වල මට්ටමක පැවතුනි.

(ඈ) අධිකාරිය විසින් රණවිරුවන් වෙත තාවකාලික බලපත්‍ර මගින් ලබාදී තිබුණු බලංගොඩ, කෑගල්ල, මීරිගම හා මාළඹේ පිහිටි ඉඩම් කොටස් 15කට අදාලව ඔප්පු සකස් කිරීමේ කටයුතු 2018 ජනවාරි 22 විගණන දින වන විටත් සිදු කර නොතිබුණි.

**4.2** මතභේදයට තුඩුදෙන ගනුදෙනු
-----------------------------------

2004 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධිකාරියේ පරිගණක ක්‍රියාකරු තනතුරට පත්කර තිබුණු නිලධාරිනියක් 2009 දී වර්ෂ 02 කාලයක් සඳහා වැටුප් රහිත විදේශ නිවාඩු ලබාගෙන තිබුණු නමුත් බැඳුම්කරයේ කොන්දේසි කඩකර පසුව සේවයෙන් ඉවත්වී තිබුණි. මෙම නිලධාරිනියගෙන් අධිකාරියට අයවිය යුතු රු.530,380 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුනු අතර ඇයගේ පෞද්ගලික ලිපිගොනුවද අස්ථානගත වී තිබුණි.

**4.3** දෘශ්‍ය අක්‍රමිකතා
-------------------

රණවිරු මාපිය රැකවරණ දීමනා ක්‍රමය යටතේ එක් රණවිරු මවකට හෝ පියෙකුට වර්ෂයකට රු.9,000 බැගින් වූ දීමනාවක් පමණක් ගෙවිය හැකි වුවත් 2016 ජූනි මාසයේ සිට 2017 නොවැම්බර් මාසය දක්වාවූ මාස 18 ක කාලය තුල රණවිරුවෙකුගේ පියෙකු ලෙස හඳුනාගත් පුද්ගයෙකුගේ පෞද්ගලික බැංකු ගිණුමකට රු.819,750 ක් මුදලක් බැරකර තිබුණු බව නිරීක්ෂණය විය. මීට අමතරව රණවිරුවෙකුගේ මව හෝ පියා නොවූ පිටස්තර පුද්ගලයෙකු වෙත උක්ත කාල සීමාව සඳහා රු.5,120,250 ක මුදලක් ගෙවා තිබුණු බවද විගණනයේදී නිරීක්ෂණය විය. මේ සම්බන්ධව සිදුකර තිබුණු අභ්‍යන්තර පරීක්ෂණයේදී ඉහත ගෙවීම් සම්බන්ධයෙන් අක්‍රමිකතාවයක් සිදුවී තිබුණු බව තහවුරු කර තිබුණු අතර ඒ සඳහා නීතිමය පියවර ගැනීම සඳහා නිර්දේශ කර තිබුණි. මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පැවතුණි.

**4.4** නිශ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රණවිරු ප්‍රමුඛතා හැදුනුම්පත් මුද්‍රණය සඳහා 2014 වර්ෂයේ රු.651,739 කට මිලදීගෙන තිබුණු මුද්‍රණ යන්ත්‍රයක් ඇතුලුව පිරිවැය රු.229,500 ක්වූ ඇඟිලි සලකුණු යන්ත්‍ර 02 ක් හා පිරිවැය රු.42,158 ක්වූ පරිගණක මේස 06 ක් අධිකාරියේ පරිශ්‍රය තුල වර්ෂ 02 කට වැඩි කාලයක් නිශ්කාර්යව පැවතුනි. මීට අමතරව 2015 සැප්තැම්බර් මාසයේදී පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වටිනාකම රු.152,000 ක්වූ ලැප්ටොප් පරිගණක 04 ක් නිශ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණන වටිනාකම රු.62,625,000 ක් හා ප්‍රමාණය වර්ග අඩි 11548 ක් වූ ප්‍රධාන කාර්යාලයීය ගොඩනැගිල්ලේ වර්ග අඩි 2887 ක් වූ ඉහළ මහල 2001 වර්ෂයේ සිට ප්‍රයෝජනයට නොගෙන පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) 2012 වර්ෂයේ මිලදී ගෙන තිබුණු මෝටර් රථය සඳහා සමාලෝචිත වර්ෂය තුල අළුත් වැඩියා වියදම් වශයෙන් රු.203,598 ක් වැයකර තිබුණු නමුත් කිලෝමීටර් 300 ක් පමණක් ධාවනය කර තිබුණි. තවද, අධිකාරිය සතු වටිනාකම රු.1,975,000 ක් වූ වෙනත් මෝටර් රථයක් සහ වටිනාකම රු.900,000 ක් වූ කැබ් රථය වර්ෂ 2 ක සිට නිෂ්කාර්යව අධිකාරිය තුළ පවතින බව නිරීක්ෂණය විය.

**4.5** හදුනා ගන්නා ලද පාඩු

අධිකාරිය විසින් 2016 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබූ අතර 2017 වර්ෂය සඳහාවූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2018 මැයි 10 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. එම වාර්තාවට අනුව විෂයයන් 31කට අදාල භාණ්ඩ 170 ක ඌනතාවයක් සිදු වී තිබුණු බවත් නිරීක්ෂණය විය. මෙම අස්ථානගත භාණ්ඩ අතර ඩිජිටල් කැමරා 11 ක්ද අල්මාරි 4 ක්ද ,කඩබ් 2 ක්ද ලිපිගොනු රාක්ක 2 ක්ද බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර 1ක්ද, පෙන්ඩ්‍රයිව් (32 GB) 19 ක්ද විය.

**4.6** කාර්ය මණ්ඩල පරිපාලනය

1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරී පනතේ 5 (ඇ) වගන්තිය අනුව නිලධාරීන් සේවයේ නියුක්ත කිරීමේ බලතල අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය වෙත පවරා තිබුණු අතර සභාපතිනිය විසින් සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් 11 දෙනෙකු තනතුරුවලට පත්කර 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ චක්‍රලේඛයේ ඇතුළත් එම්.එම්-1-1-2006 වැටුප් ක්‍රමයේ පියවර 06ක් ඉදිරියෙන් පිහිටුවා තිබුණු බව නිරීක්ෂණය විය. අධිකාරියේ සභාපතිනියගේ පැහැදිළි කිරීම අනුව, මෙම පත්කිරීම් සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා 2015 අගෝස්තු 31 දින අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය වෙත තොරතුරු ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත් කළමනාකරණ මණ්ඩලය විසින් වැඩිදුර විමර්ශනය සඳහා කමිටුවක් පත්කර තිබුණු අතර අදාල කමිටු වාර්තාවේ පිටපතක් විගණනයට ලැබී නොතිබුණි.

**5.** **තිරසාර සංවර්ධනය**

**5.1** **තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

**තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව රණවිරු සේවා අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව දැනුවත් වී තිබුණු නමුත් එම කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුලත් කර නොතිබුණු බවත් එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට ඇතුලත් කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.**

**6.** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2018 ජූනි 28 දිනය.**

**6.1** **ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

**6.1.1** **ප්‍රසම්පාදනයන්**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ)** **අධිකාරිය විසින් 2017 ජනවාරි මාසයේදී රු.3,776,250 කට මිලදී ගෙන තිබුණු විදුලි ජනක යන්ත්‍රය සම්බන්ධව ලංසු විවෘත කිරීම ඊට නියමිත දිනය වූ 2016 දෙසැම්බර් 01 දින වෙනුවට 2017 ජනවාරි 04 දින සිදු කර තිබුණි. තවද ලංසු විවෘත කිරීම සම්බන්ධව වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණු අතර ඒ හේතුවෙන් එම කටයුතු වල විනිවිද භාවය ගැටලු සහගත විය. මේ සම්බන්ධයෙන් කාර්යසාධන බැදුම්කර ලබා ගැනීමෙන් තොරව රු.2,620,000 ක අත්තිකාරම් මුදල් නිදහස් කර තිබුණු බවත් යන්ත්‍රය ස්ථානගත කර තිබුණු පරිශ්‍රය පසුව වෙනස් කිරීම නිසා අමතර වශයෙන් රු.729,750 පිරිවැයක් දරා තිබුණු බවත් විගණනයේදී නිරීක්ෂණය විය.**

**(ආ)** **වර්ණ ඡායා පිටපත් යන්ත්‍රයක අවශ්‍යතාවය පිළිබඳ කිසිදු ඉල්ලීමකින් තොරව රු.827,770 ක් වැයකර වර්ණ ඡායා පිටපත් යන්ත්‍ර දෙකක් සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණි. මේ සඳහා ලංසුකරුවන් 6 දෙනෙකු මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර අවශ්‍ය සුදුසුකම් සපුරා තිබියදීත් ඇගයීම් කමිටුව විසින් අවම ලංසුකරුවන් 3 දෙනෙකු අවශ්‍ය සුදුසුකම් සපුරා නැති බව දක්වමින් අවම 04 වන මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ලංසුකරුට කාර්ය සාධන ඇපකරයක් ලබා නොගෙන ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. එසේම එක් ඡායා පිටපතක් සඳහා වූ පිරිවැය සහ එහි නඩත්තු වියදම් පිළිබඳ ඇගයීම් සිදුකර නොතිබුණි.**

## 6.2 අයවැය පාලනය

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේ අයවැය ලේඛනය 2018 වර්ෂයේ ජනවාරි මාසය තුලදීද සංශෝධනයට ලක්කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව අධිකාරියේ අයවැය ලේඛන පිළියෙල කිරීම වඩා තාත්විකව සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2003 ජූනි 02 දිනැති PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 වගන්තිය ප්‍රකාරව අයවැයගත ආදායම් වියදම් ප්‍රකාශනය, අයවැගත මූල්‍ය තත්ව ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමාලෝචිත වර්ෂය සඳහා සකස් කළ අයවැය ලේඛණයට ඇතුලත් කර නොතිබුණි.

## 6.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2002 මැයි 24 දිනැති අංක 21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රණවිරු සේවා අධිකාරිය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2015, 2016 වර්ෂයන්ට අදාල කාර්යසාධන වාර්තා 2018 ජූලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 07. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර රණවිරු සේවා අධිකාරියේ සභාපතිනියගේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කල යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ප්‍රසම්පාදනය | භාණ්ඩ මිලදී ගැනීම් සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු නොකිරීම. |
| (ආ) | අත්තිකාරම් පාලනය | අත්තිකාරම් නිකුත් කිරීම, පියවීම හා ඒවා උපයෝජනය කිරීම සම්බන්ධව නිසි අධීක්ෂණයක් සිදු නොවීම. |
| ( ඇ) | අභ්‍යන්තර පාලනය | අධිකාරිය තුල පවතින අංශයන්හි කාර්යයන් මනාව ක්‍රියාත්මක කරවීමට හැකි වන පරිදි මනා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර නොතිබීම. |